# බළන්ගොඩ නගර සභාව

## 2018-05-28 දින මහා සභා වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**
**දිනය - 2018-05-28**
**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. ප්‍රේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

**01. පසුගිය සභාවේ සභා වාර්තාව සම්මත කිරීම**

පසුගිය සභාවේ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම්දුන් අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. ප්‍රේමදාස මැතිතුමන් විසින් 2018.04.05 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් එය ස්ථිර කරන ලදුව පසුගිය සභාවේ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන**

ගරු නාගරික මන්ත්‍රි ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් ගෙනෙන ලද යෝජනාවක් අනුව ගරු සභාපතිතුමන් විසින් බලංගොඩ නගර සභාවේ හිටපු උප සභාපතිවරයෙකු වූ සුනිල් කැමිලස් ප්‍රනාන්දු මහතාගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීම සිදුකරන ලද අතර එතුමා බලංගොඩ පුරවරයට කරන ලද ඉමහත් සේවය ගෞරවයෙන් සිහිපත් කරන ලදී.

එමෙන්ම ගරු උපසභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ගෙනෙන ලද යෝජනාවකට අනුව වෙසක් පෝය නිමිත්තෙන් බලංගොඩ නගරය පුරා වෙසක් සැරසිලි සිදු කිරිම හා මඤ්ඤොක්කා දන්සැල සාර්ථක කර ගැනීමට විවිධ අයුරින් සහයෝගය දැක්වූ සියළුම දෙනාට ගරුසභාපතිතුමන් විසින් මෙහිදී විශේෂ ස්තුතිය පළකරන ලදී

එමෙන්ම සභාවේ කටයුතු ක්‍රමානුකුලව පවත්වාගෙන යාම සඳහා සියළුම සභික මහත්ම මහත්මීන්ගේ දුරකථන සභාව පවත්වාගෙන යන අතරතුර ක්‍රියා විරහිත කර තබන මෙන් ගරු සභාපතිතුමා සභාවට දැනුම් දෙන ලදී.

**03. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම**

මෙදින මහ සභාවට සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් වූයේ නැත.

**04. කල් දී ඇති ප්‍රශ්න**

***04:01 නගරයේ කඩසාප්පුවල භාණ්ඩ ඇසිරීම, භාණ්ඩ එල්ලීම,නාම පුවරු ප්‍රදර්ශනය,පිරිසිදුකම හා විනය පිළිබද වෙළෙඳ සැල් හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම. ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා***

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා මෙවැනි වැඩසටහනක් ඉදිරි දිනකදී වෙළෙද සංගමයේද සහයෝගය ඇතිව පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙහිදී පවසා සිටින ලදී.

***04:02 2017 වර්ෂයේ අවසානයේ පොදු ගිණුමේ කොපමණ මුදල් ඉතිරි වූවාද ? ගරු නාගරික මන්ත්‍රි නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා***

ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් මේ සඳහා පිළිතුරු සපයමින් 2017 වර්ෂයේ අවසානයේ පොදු ගිණුමේ ශේෂය රු.1,955,553.65 බව ගරු සභාවට පවසා සිටින ලදී.

***04:03 2017 වර්ෂය සඳහා සංවර්ධනය කිරීමේදි මුදල් ගෙවීමට තිබේද ? ගරු නාගරික මන්ත්‍රි නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා***

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා බැංකියවත්ත ආරක්ෂිත පැතිබැම්ම සඳහා රු.7,057,138.00 ක මුදලක් හා උඩ ඇල්ලෙපොළ පල්ලෙකුඹුර

මාර්ගයේ ගලක් කඩා ඉවත්කිරීම සඳහා රු.19,840.00 ගෙවීමට තිබෙන බව ගරු සභාවට පවසා සිටින ලදී.

*04:04 2018 වර්ෂය සඳහා කොපමණ ආදායමක් අපේක්ෂිතද? ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා*

මේ සඳහා පිලිතුරු ලබාදුන් ගරු සභාපති චමික ජයමිණී විමලසේන මැතිතුමා 2018 වර්ෂය සඳහා ආදායම පුනරාවර්තන ලැබීම් ලෙස රු. 119,410,000.00 හා ප්‍රාග්ධන ලැබීම් ලෙස රු. 29,550,000.00 අපේක්ෂා කරන බව ගරු සභාවට පවසා සිටින ලදී.

*04:05 පඩිනඩි,නඩත්තු සහ වියදම් සිදුකිරීමෙන් පසු කොපමණ මුදලක් ඉතිරිවේද? ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා*

පඩිනඩි,නඩත්තු සහ වියදම් සිදුකිරීමෙන් පසු ඉතිරි 14,900,000.00 වන අතර එම සම්පූර්ණ මුදල සභාව විසින් සිදුකරනු ලබන ප්‍රාග්ධන භාණ්ඩ,සේවා සහ වැඩ සඳහා යෙදවීමට අපේක්ෂා කෙරෙන බව ගරු සභාපතිතුමා විසින් සභාවට පවසා සිටින ලදී.

*04:05 මාළු කඩවලට පැවරූ නඩුවේ ප්‍රගතිය කුමක් වීද? ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා*

මාළු කඩවලට පැවරූ නඩුවේ තීන්දුව ලබාදීම 2018-05-30 දිනට කල් ගිය බැවින් තීන්දුව ලබා නොදුන් බව ගරු සභාපතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙදින පෙ. ව. 10.15 ට පමණ පහත නම් සඳහන් ගරු නාගරික මන්ත්‍රීවරුන් ගරු සභාව වෙත පැමිණෙන ලදී.

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |

ඉහත නම් සඳහන් ගරු නාගරික මන්ත්‍රිවරුන් පැමිණීම ප්‍රමාද වීම නිසා කල් දී ඇති ප්‍රශ්න සඳහ නැවත පිළිතුරු අපේක්ෂා කල බැවින් ගරු සභාපතිතුමා විසින් නැවත එම කල්දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු ලබාදෙන ලදී.

**05. කල් දී ඇති යෝජනා**

*05:01 ගරු සභාපති චමික ජයමිණී විමලසේන මැතිතුමා*

**05:01:01 බස් නැවතුම්පොළ වෙළෙඳ සංකීර්ණයේ පොලිස් මුරපොළක් ස්ථාපනය කිරීම.**

බස් නැවතුම්පොළ වෙළෙඳ සංකීර්ණයේ පොලිස් මුරපොළක් ස්ථාපනය කිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.එහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා කලින් වකවානුවලදී පැවති පොලිස් මුරපොළ වාණිජ අවශ්‍යතා සඳහා ව්‍යාපාරික ස්ථානයක් බවට පත්කර ඇති බවත් , විවිධ අපචාර ක්‍රියා සිදුවන බැවින් වෙළඳාම් කටයුතු අඩුවී ඇති නිසාත් වෙළෙඳ සැල් හිමියන් පැමිණිලි කිරීම හා ඔවුන්ගේ ඉල්ලීම නිසා බස් නැවතුම්පොළ වෙළෙඳ සංකීර්ණයේ පොලිස් මුරපොළක් ස්ථාපනය කිරීම සඳහා අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති කාමරයට යාබදව ඇති වැසිකිලි සංකීර්ණයේ කොටසක් සකස් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.විරෝධතා ඉදිරිපත් නොවූ අතර එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:02 නගර සභා කාර්යාල ගොඩනැගිල්ලට අළුතින් කොටසක් ඉදිකිරීම**

නගර සභා කාර්යාල ගොඩනැගිල්ලට අළුතින් කොටසක් ඉදිකිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මෙහිදී සභාවේ ගරු සභිකයන් හට රැදී සිටීම සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් වෙන් කර දීමේ අරමුණින් කාර්යාල ගොඩනැගිල්ලට අළුතින් කොටසක් ඉදිකිරීමට අපේක්ෂා කරන බැවින් ඒ සඳහා ඉදිරි කටයුතු සූදානම් කලයුතු බව ගරු සභාපතිතුමා විසින් පවසා සිටින ලදී. මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:03 බැංකියවත්ත ප්ලාස්ටික් පොලිතින් ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා සුදුසු ලංසුකරුවෙකු තෝරාගැනීම**

බැංකියවත්ත ප්ලාස්ටික් පොලිතින් ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට සුදුසු ලංසුකරුවෙකු තෝරාගැනීමට අවශ්‍ය වී ඇති බවත්, වර්තමාන ලංසුකරුගේ ගිවිසුම් කාලය අවසන් වී ඇති බැවින් මේ සඳහා පුවත්පත් දැන්වීමක් මගින් ලංසුපත් කැඳවා ලංසුකරුවෙකු තෝරා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලදී. මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් වර්තමාන ටෙන්ඩර්කරුගේ කාලය දීර්ඝ කිරීම සුදුසු බව පවසා සිටින ලදී.මේ පිළිබඳ සභාවේ පළවූ විවිධ අදහස් සළකා නගර සභාව මගින් පනවන ලද නිර්නායක සඳහා අනුගතව වර්තමාන ටෙන්ඩර්කරුට 2018 දෙසැම්බර් 31 දක්වා අදාළ ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සුදුසු බව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05៖01៖04 බලංගොඩ නගර සභාව සඳහා අළුතින් ට්‍රැක්ටර් රථයක් මිලදී ගැනීම.**

බලංගොඩ නගර සභාව සඳහා භාවිතයේ ඇති ට්‍රැක්ටර් පැරණි තත්වයේ ඇති හෙයින් හා සේවා අවශ්‍යතාවය මත ට්‍රැක්ටර් රථයක ඇති අවශ්‍යතාවය සළකා බලා අළුතින් ට්‍රැක්ටර් රථයක් මිලදී ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05៖01៖05 පොදු වෙළෙඳ සැළ මහල් 5 න් ඉදිකිරීම සහ එහි සැලැස්ම සකස් කිරීම.**

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රජා යටිතල පහසුකම් නගා සිටුවීමේ වැඩසටහන යටතේ රු.මිලියන 25 ක මුදලක් ලැබීමට නියමිත බැවින් පොදු වෙළෙඳ සැල පිහිටි ස්ථානයේ මෙම මහල් 5න් යුත් පොදු වෙළෙඳ සැළ ඉදිකිරීමට අපේක්ෂා කෙරෙන බවත් මෙම සැළසුම පළාත් ඉංජිනේරු කාර්යාලය හරහා සැදීමට අපේක්ෂා කරන බැවින් ඒ සඳහා යන වියදම සහා අරමුදල මගින් යෙදවීමට ගරු සභාවේ අනුමැතිය පතමින් ගරු සභාපතිතුමා විසින් යෝජනාව ඉදිරිපත් කරන ලද අතර එය ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.නිමල් ගාමිනී වීරසිංහ මැතිතුමා මෙය මහල් පහකින් ඉදිකිරීම කාලෝචිත නොවන බවත් මහල් 2ට යාම සුදුසු බවත් දැනට තිබෙන මුදලින් පොදු වෙළෙඳ සැළ නවීකරණය කර,ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සුදුසු බවටත් අදහස් පළ කරන ලදී.

**05៖01៖06 බොබ්කැට් යන්ත්‍රය සඳහා ටයර් ලබාගැනීම.**

බොබ්කැට් යන්ත්‍රය සඳහා ටයර් ලබාගැනීම සඳහා රු.628,000.00 ක මුදලක් වැයවන බැවින් එය මිලදීගැනීමට සභාවේ අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ති එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05៖01៖07 2018.04.05 දිනයෙන් තීරණය කරන ලද සභාව පවත්වන දිනය සංශෝධනය කිරිම.**

මාසික මහ සභාව පැවැත්වීම සඳහා සැම මසකම අවසන් බ්‍රහස්පතින්දා සුදුසු යයි 2018-04-05 දින මහ සභාවේ ගත් තීරණය සංශෝධනය කර සැම මසකම දෙවන බ්‍රහස්පතින්දා පැවැත්වීම සුදුසු යෝජනා කල අතර එහිදී එමගින් සභාවේ කටයුතු සිදුකිරීමේදි හා අඩාළව කල්තැබීම වැනි අවස්ථාවලදී අදාළ මාසය තුළම ක්‍රියාත්මක වීමට හැකිවන බවත් මෙහිදී පවසා සිටින ලදී.මෙම යෝජනාව ගරු නාගරික

මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05෴01෴08 නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘති ආධාර යටතේ ඉදිකරන ලද වැසිජල කාණු පද්ධතියේ ණය මුදල ගෙවීම.**

2017-12-15 දිනැති නඩු තීන්දුවෙන් ඉහත ඉදිකිරීම සඳහා ලබාගත් ණය මුදල සභාවට ගෙවීමට තීන්දු වී ඇති බවත් ඒ අනුව දේශිය ණය සංවර්ධන අරමුදල මගින් නැවත ණය පියවීමේ සැකැස්ම මෙම සභාව වෙත එවා ඇති අතර එහි සඳහන් පරිදි,

| | |
|---|---|
| ගෙවිය යුතු මුල් ණය මුදල | - 8,815,586.29 |
| හිඟ වූ පොළිය | - 9,520,333.42 |
| මුළු ණය මුදල | -18,335,919.75 |

මෙහි වාරිකයක අගය රු. 202,918.84 වශයෙන් වාරික 108න් ගෙවීමට ගරු සභාපතිතුමා ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු උප සභාපතිතුමා විසින් අදහස් දක්වමින් පෙර පැවති සභාවලින් මෙම මුදල ගෙවීම ප්‍රතික්ෂේප කලද නඩු තීන්දු දෙකකින් මෙම මුදල ගෙවීමට නියම කර ඇති නිසා මෙම මුදල ගෙවීම පැහැර හැරිය නොහැකි බව පවසා සිටින ලදී.

මෙය රජයෙන් කලයුතු සංවර්ධන කටයුත්තක් බැවින් අදාළ ණය මුදල හා පොළිය කපා හරින ලෙස විෂය භාර අමාත්‍යවරයා හා මුදල් අමාත්‍යවරයා දැනුවත් කරන ලෙස ලිපියක් සකස් කර ණය මුදල නොගෙවා සිටිමට උත්සාහයක් දරණ ලෙස ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.නිමල් ගාමිනී වීරසිංහ මැතිතුමා විසින් මෙහිදී අදහස් ඉදිරිපත් කරන ලදී.

**05෴01෴09 කාර්යාලීය පණිවිඩකරුගේ පෞද්ගලික යතුරු පැදිය සඳහා ඉන්ධන ලබාදීම**

සභාවේ මන්ත්‍රිවරුන්ගේ ලිපි බෙදාදීමේ කටයුතු නිරන්තරයෙන් සිදුකිරීම හා කාර්යාලීය ලිපි හුවමාරු කටයුතු සිදුකිරීම සඳහා ඉන්ධන ලබාදෙන මෙන් පණිවිඩකරු විසින් කරන ලද ඉල්ලීම සළකා පණිවිඩකරුගේ පෞද්ගලික යතුරු පැදිය සඳහා මාසයට ලීටර් 10 ඉන්ධන ලබාදීමට සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05፥01፥10 සෞඛ්‍යය කම්කරු ජී.ජී.ජානක රංජන් බණ්ඩාර , වැඩ කේෂත්‍ර කම්කරු ජී.දයාරත්න යන අයගේ සේවා ගිවිසුම් අළුත් කිරීම හා නැවත සේවයට බඳවා ගැනීම.**

සෞඛ්‍යය කම්කරු ජී.ජී.ජානක රංජන් බණ්ඩාර , වැඩ කේෂත්‍ර කම්කරු ජී.දයාරත්න යන අයගේ වාර්ෂික සේවා ගිවිසුම් අළුත් කිරීම හා නැවත සේවයට බඳවා ගැනීම සඳහා ගරු සභාපතිතුමා ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05፥01፥11 කසළ ටෙන්ඩරයේ වර්තමාන ටෙන්ඩර්කරු ඉවත්වීම නිසා නැවත ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම.**

කසළ ටෙන්ඩරයේ වර්තමාන ටෙන්ඩර්කරු ඉවත්වීම නිසා නැවත ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම සඳහා ගරු සභාපතිතුමා ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරනලදී.

මෙහිදී සභාවට ගරු සභාපතිතුමා විසින් අදහස් දක්වමින් කම්කරුවන් 18 ක් පමණ යොදාගෙන සිදුකල යුතු පිරිසිදු කිරීම් කම්කරුවන් 4 ක් හෝ 5ක් පමණ යොදාගෙන සිදුකරමින් නගර සීමාව තුළ ගිවිසුම් ප්‍රකාරව කිසිදු පිරිසිදු කිරීමක් නිසියාකාරව සිදු නොකිරීමත්, අදාළ සේවකයන් හට වැටුප් නොගෙවා නගරයේ දෛනික පිරිසිදු කිරීම් කටයුතු සිදුනොකිරීමත්, ටෙන්ඩර්කරු ඉවත් වෙන බව ලිඛිතව ලබාදීමත් යනාදි සාධක හේතුවෙන්,පළමු ටෙන්ඩරය අවලංගු කර දෙවන ටෙන්ඩර්කරුට ටෙන්ඩරය ලබාදීමට යෝජනා කරන ලදී.

මෙහිදි අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා හා රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් අදහස් දක්වමින් නගරයේ පොළ භූමිය ඉතා අපවිත්‍ර වී ඇති බවත් අප්‍රේල් 11 සහ අප්‍රේල් 12 යන දෙදින පිරිසිදු කිරීම් සිදුකර නොතිබූ බවටත් කරුණු පෙන්වා දෙන ලදී. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් නගර සීමාව පුළුල් වීමත් සමඟ වැඩි සේවක පිරිසක් සේවයේ නිරත කල යුතු බැවින් ලැබෙන මුදලින් කම්කරුවන්ට වැටුප් ගෙවීමට අපොහොසත් වී ඇති බවත් රියදුරන්ගේ සේවයට පැමිණීමේ ප්‍රමාදය කසල ප්‍රශ්නය වැඩිවීමට හේතු වී ඇති බවත් පවසා සිටින ලදී. මෙහිදී ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමා අදහස් දක්වමින් ටෙන්ඩර්කරු මාරුවූවද සේවයේ යෙදෙන්නේ එකම සේවක පිරිසක් බැවින් ඉන් ප්‍රතිඵලයක් නොවන බව පවසා සිටින ලදී.

මෙහිදී මේ පිළිබඳ වැඩි දුරටත් කරුණු පැහැදිලි කරගැනීම සඳහා ගරු සභාපතිතුමා ගෙනා යෝජනාවෙන් ගරු උප සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක

සභාවක් බවට පත්විය.එහිදී සෞඛ්‍යය පරිපාලකවරිය කරුණු පැහැදිලි කිරීමෙන් පසු ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් ගරු උප සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්විය. මෙහිදී ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමා අදහස් දක්වමින් ටෙන්ඩර්කරු මාරුවූවද සේවයේ යෙදෙන්නේ එකම සේවක පිරිසක් බැවින් ඉන් ප්‍රතිඵලයක් නොවන බව පවසා සිටි අතර ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් දැනට සේවයේ නිරත සෞඛ්‍යය පරිපාලකවරියට අමතරව වෙනත් නිළධාරියෙකු අධීක්ෂණ කටයුතු සඳහා යෙදවීම සුදුසු බව ගරු සභාවට පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා කසළ ටෙන්ඩරය ලබාදෙන්නේ අධීක්ෂණය ඇතුළු සියළු පිරිසිදු කිරීම් සඳහා බවත් ඉන් ඔබ්බට අධීක්ෂණ කටයුතු සඳහා නිළධාරින් පත්කර ඇති බවත් ටෙන්ඩර්කරු සේවයේ නිරත කරන්නේ කවුරුන්ද යන ගැටළුව නොව පාලනය නිසියාකාරව සිදුකිරීම වැදගත් බවත් පවසා සිටින ලදී.

අවසානයේ සභාවෙන් පලවූ අදහස් සළකා ගරු සභාපතිතුමා කසල ටෙන්ඩරයේ වර්තමාන ටෙන්ඩර්කරු ඉවත්වීම නිසා දෙවන ටෙන්ඩර්කරුට පළමු ටෙන්ඩර්කරුගේ මුදලටම ලබාදීමට හෝ පළමු ටෙන්ඩර්කරුගේ මුදල වැඩිකිරීම පිළිබඳ දෙපාර්ශවය සමඟ සාකච්ඡා කර තීරණය ඉදිරි සභාවට යොමු කිරීමට කල යෝජනාව ගරු උප සභාපති එම්.ටී.රූමි මැතිතුමා විසින් තීරණය කරන ලදුව එම තීරණය සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ01ඃ12 **නගරයට පිවිසුම් වන ඔරලෝසු කණු පරිශ්‍රය බැනර්,කටවුට් තොර කළාපයක් බවට පත්කිරීම ප්‍රකාශයට පත්කිරීම හා නගර සභා බල ප්‍රදේශය තුළ ඇති සියළුම අනවසර දැන්වීම් පුවරු ඉවත්කිරීම.**

ඔරලෝසු කණුව පරිශ්‍රය නගරයට පිවිසෙන ප්‍රවේශය බැවින් එය අලංකාරව පවත්වා ගැනීම අවශ්‍යයම කරුණක් වන බැවින් නිරන්තරයෙන්ම දැන්වීම් කටවුට් වලින් හා විවිධ දැන්වීම් මගින් එම ප්‍රදේශය ඉතාමත් අවලස්සන වීම නතර කළ නොහැකි කාරණයක් බවට පත්ව ඇති බැවින් හා ස්ථිර දැන්වීම් පුවරු අනුමැතියකින් තොරව නාගරික බල ප්‍රදේශය පුරා ස්ථාපනය කර ඇති නිසාත් සභාවට ලැබිය යුතු විශාල ආදායමක් අහිමි වීම හා මහජනයාට පීඩාකාරී වන බැවින් මෙම අනවසර පුවරු ඉවත් කිරීමට හෝ නීත්‍යානුකුල කිරීම සිදු කළ යුතුව ඇති බව පැවසූ ගරු සභාපතිතුමා විසින් නගරයට පිවිසුම් වන ඔරලෝසු කණු පරිශ්‍රය බැනර්,කටවුට් තොර කළාපයක් බවට පත්කිරීම ප්‍රකාශයට පත්කිරීම හා නගර සභා බල ප්‍රදේශය තුළ ඇති සියළුම අනවසර දැන්වීම් පුවරු ඉවත්කිරීම සඳහා ගෙනා යෝජනාව ගරු

නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.එහිදී එම යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ13 පොදු වෙළෙඳ සැළ අංක 14 කඩකාමරය එම්. සුජිත් කුමාර යන අයට ලබාදීම.**

පොදු වෙළෙඳ සැළ අංක 14 කඩ කාමරය වසා දමා ඇති අතර ගැනුම් කරුවෙකු ඉදිරිපත් නොවීම හේතුවෙන් මෙම කඩකාමරය ඉහත ඉල්ලුම්කරු විසින් තක්සේරු මුදල වන රු. 7500.00කට ලබාගැනීමට එකඟ වන්නේ නම් එම මුදලට ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී සභාවෙන් පළවූ බහුතර අදහස වූයේ ඉල්ලුම්කරුගේ ඉල්ලීම පරිදි ගබඩා සඳහා පමණක් අදාළ කඩ කාමරය ලබාදීම පොදු වෙළෙඳ සැල් ගිවිසුමට පටහැනි බැවින් ව්‍යාපාරයක්ද කරගෙන යා යුතු බවයි. මෙම අදහස සළකා බැලූ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා පොදු වෙළෙඳ සැළ අංක 14 කඩ කාමරය ව්‍යාපාර කටයුත්තක් සමග ගබඩා සදහා භාවිතා කරන්නේ නම් පමණක් නම් තක්සේරු මුදල වන රු.7500.00ක මුදලට ලබාදීමට යෝජනා කල අතර එය ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව එය සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ14 කහටපිටිය හපුගහකුඹුර විද්‍යාලයට භාවිතයෙන් ඉවත්කල පුස්තකාල පොත් ලබාදීම.**

කහටපිටිය හපුගහකුඹුර විද්‍යාලයේ ඉල්ලීම පරිදි භාවිතයෙන් ඉවත්කල පුස්තකාල පොත් ලබාදීම සඳහා ඉවත්කල පොත් පිළිබඳ විස්තරයක් අදාළ පාසල වෙත යවා එම පොත් පාසල වෙත සුදුසු නම් ලබාදීමටත්, පාසලට අවශ්‍ය නොවේ නම් එම පොත් වෙන්දේසි කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**05ඃ01ඃ15 වරුණ උමේධ කාර් පාක් අංක 10 කඩකාමරයේ බදු අයිතිය සංශෝධනය කිරීම.**

කාර්පාක් අංක 10 කඩකාමරයේ සන්තකය දරන ලද මාලා මංගලිකා යන අය මියගොස් ඇති බැවින් ඇයගේ පුතුන් දෙදෙනෙකු සිටින අතර එල්.වරුණ උමේධ සිල්වා යන අයට කඩකාමරය ලබාදීම පිළිබද ඔහුගේ සහෝදරයා වන එල්.රුක්ෂාන් ධනුෂ්ක සිල්වා යන අය එකඟතාවය පළකර ඇත. එම නිසා එල්.වරුණ උමේධ සිල්වා යන අය නමින් කාර්පාක් අංක 10 කඩකාමරයේ නම සංශෝධනය කිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ16 කාර්පාක් අංක 6 කඩකාමරය තක්සේරු මුදලට ලබාදීම**

ගරු සභාපතිතුමා මේ පිළිබද අදහස් දක්වමින් මෙම කඩකාමරය ඉන්දික පැතුම් යන අය නගර සභාවෙන් ටෙන්ඩර් මගින් ලබාගෙන තිබූ කඩකාමරයක් බවත් ඉන්දික

පැතුම් යන අය අරුණි ගමගේ යන අයට මෙම කඩකාමරය බඳුදී තිබියදී ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත රු.780,000.00 ක keymoney මුදලක් හා රු. 30,000.00ක ගිවිසුම් ඇප මුදලක් ගෙවීමෙන් අනතුරුව අරුණි ගමගේ යන අය කඩකාමරයේ බදු අයිතිය ලබාගන්නා ලද බැවින් දැනට අයකරන රු.10,000 ක කුළිය වෙනුවට තක්සේරු මුදල වන රු.5750/= ක මුදල අයකිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය මෙම කාර්පාක් අංක 6 කඩකාමරය 1977 වර්ෂයේ සිට මංගල රෙකෝඩ් බාර් නමින් ආනන්ද යන අය 2011 වර්ෂය වන තෙක් ව්‍යාපාර කටයුතු කර ගෙන ගිය බවත් 2012 වර්ෂය නගර සභාව මගින් ටෙන්ඩර් කිරීමේදි රු.10 000 මුදලට ආනන්ද යන අයගේ බිරිඳට ලබාදුන් අතර මුදල් නොගෙවීම නිසා සීල් කිරීමෙන් පසු වර්තමාන ගැනුම්කරු වෙත ලබා දී ඇති බවත්, 1977 වර්ෂයේ සිට ව්‍යාපාර කටයුතු කරගෙන ගිය ආනන්ද යන අයට මෙම කඩ කාමරය ලබාදෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.
මෙහිදී ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.ආදායම් පරීක්ෂකගේ කරුණු පැහැදිලි කිරීමෙන් පසුව කාරක සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් මහ සභාවක් බවට පත්විය.

මෙහිදී අදායම් පරීක්ෂක විසින් පැහැදිලි කර දුන් කරුණු පදනම් කරගෙන ගරු සභාපතිතුමා විසින් අදහස් දක්වමින් ගරු ආණ්ඩුකාරවරයා විසින් මෙම අංක 6 දරණ කඩකාමරය අරුණි ගමගේ යන අයට ලබාදෙන ලෙස නියෝගයක් එවා ඇති බවත් ඒ අනුව ගරු ආණ්ඩුකාරවරයාගේ නියෝගය මත මෙය ක්‍රියාවට නංවා ඇති බවත් පවසා සිටින ලදී.

මෙහිදී අදහස් පල කල ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.නිමල් ගාමිනී වීරසිංහ මැතිතුමා,ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා,ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් දීර්ඝ කාලයක් මෙහි ව්‍යාපාර කටයුතු කරගෙන සිටි ආනන්ද යන අයට මෙම කඩ කාමරය ලබාදීම සුදුසු බවත් සභාව විසින් ගත් තීරණය ආණ්ඩුකාරවයා වෙත දන්වා යැවීම සුදුසු බවත් ගරු සභාවට පෙන්වා දෙන ලදී.මෙහිදී මෙම කරුණු

සැලකිල්ලට ගෙන ගරු සභාපතිතුමා විසින් අරුණි ගමගේ යන අයගෙන් පවරාගෙන මුල් හිමිකරු වන ආනන්ද යන අයට ලබාදීම සුදුසු බවට ගරු ආණ්ඩුකාරතුමිය දැනුවත් කර ලිපියක් සකස් කිරීමට ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**මෙම අවස්ථාවේදී ප.ව. 12.45ට පමණ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් සභාවේ මූලාසනය ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාට පවරා ගරු සභාවෙන් පිටව ගිය අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් සභාවේ මූලාසනය මෙහෙයවන ලදී.**

05:01:17 **2019 වර්ෂයට අදාළ ව්‍යාපාරික ස්ථාන පිළිබඳ සමීක්ෂණය පැවැත්වීම.**

නාගරික බල ප්‍රදේශයේ ව්‍යාපාරික ස්ථාන හඳුනා ගැනීම තුළින් කාර්යක්ෂම බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාරික බදු අයකර ගැනීම හා ප්‍රදේශයේ ඇති ව්‍යාපාරික ස්ථාන පිළිබඳව දැනුවත් වීම මූලික අරමුණ කොටගෙන 2019 වර්ෂයට අදාළ ව්‍යාපාරික ස්ථාන හඳුනාගැනීම සඳහා ව්‍යාපාරික ස්ථාන පිළිබඳ සමීක්ෂණය පැවැත්වීම සුදුසු බවට ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.නිමල් ගාමිනී වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

05:01:18 **ජැකලංකා ඇපරල් පුද්ගලික සමාගමට ගලි බවුසරය සැපයීම වෙනුවෙන් අයවිය යුතු හිඟ මුදල කපාහැරීම.**

ජැකලංකා ඇපරල් පුද්ගලික සමාගම මේ වන විට ඇවර කර ඇති හෙයින් හා ලේඛනවල හිඟ මුදලක් සටහන් වීම නිසා නිරන්තරයෙන්ම විගණන විමසුම් වලට භාජනය වීම නිසා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යටත්ව ගලි බවුසරය සැපයීම වෙනුවෙන් අයවිය යුතු මෙම හිඟ මුදල කපාහැරීම සඳහා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.නිමල් ගාමිනී වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

05:01:19 **කාර්යය මණ්ඩලය හා සියළු සභිකයන් සඳහා නායකත්වය හා ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.**

කාර්යය මණ්ඩලය හා සියළු සභිකයන් සඳහා නායකත්වය හා ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් පුහුණු වැඩමුළුවක් පැවැත්වීම සඳහා එක්දින වැවඩමුළුවක් වෙනුවෙන් කුඹල්ගම Adventure ආයතනය තෝරා ගෙන ඇති බවත් එක්

සාමාජිකයෙක් සඳහා රු.3750 බැගින් සාමාජිකයන් 100ට ආසන්න පිරිසක් සහභාගි කරවා ගැනීමා අපේක්ෂා කරන බවත් පවසා ඒ සඳහා සභාවේ අනුමැතිය පිණිස ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:20 බලංගොඩ නගර සභා සීමාව තුළ ලොතරැයි අලෙවි කුටි ස්ථානගත කිරීම විධිමත් කිරීම**

නගරයේ පදික කඩ ඉවත් කර ඇති අතර ඒ අතරට ලොතරැයි අලෙවි කුටි ඉතා අවිධිමත් ලෙස පදික වේදිකාව මත තබා තිබීම නිසා නගරයේ අලංකරණයට බාධා වී ඇත. එසේම ලොතරැයි කුටි වලට පමණක් පදික වේදිකාව මත ඉඩ ලබාදීම තුළ අනෙකුත් පදික වෙළඳුන් නැවත පදික වේදිකාව ආක්‍රමණය කිරීමට පෙළඹෙමින් සිටින නිසා විධිමත් ක්‍රමවේදයකට ලොතරැයි කුටි ස්ථාපිත කිරීම සුදුසු බවට ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ඉදිරිපත් කල අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:21 මිශ්‍ර වෙළෙඳ ව්‍යාපාරය කරගෙන යාම සඳහා අනුමැතිය ලබාගැනීම. එස් රිදීවිට මයා**

මිශ්‍ර වෙළෙඳ ව්‍යාපාරය කරගෙන යාම සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා එස් රිදීවිට මයාගේ ලිපිය ගරු සභාවට ඉදිරිපත් කල ගරු උප සභාපතිතුමා ගැසට් නිවේදනය අනුව ප්‍රකාශයට පත් කර ඇති වෙළෙද පොළ සීමාවේ එළවළු වෙළදාම සඳහා අවසර ලබා දී නොමැති හෙයින් මේ සඳහා අවසර ලබානොදිය හැකි බව යෝජනා කල අතර මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව ප්‍රතික්ෂේප කරමින් අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.නිමල් ගාමිනී වීරසිංහ මැතිතුමා ඉහත යෝජනාව සංශෝධනය කර වෙළෙද පොළ සීමාව තුළ මස් ,මාළු හා එළවළු,පළතුරු වැනි වෙළෙද ව්‍යාපාර කිරීම සිදු වෙන බැවින් ඉහත පුද්ගලයාටද මේ සඳහා සාධාරණයක් ඉටුවිය යුතු බැවින් 2018 වර්ෂය සඳහා මිශ්‍ර වෙළෙද ව්‍යාපාරය යටතේ බලපත්‍රයක් ලබාදෙන ලෙසත් 2019 වර්ෂයේ සිට කිසිවෙකුට වෙළෙද පොළ සීමාව තුළ මස් ,මාළු හා එළවළු,පළතුරු වැනි ව්‍යාපාර සිදුකිරීම සඳහා ඉඩ ලබානොදෙන බවට අදාළ වෙළඳුන් දැනුවත් කිරීමත් සුදුසු බව යෝජනා කරනලදී.මෙය සනාථ කරමින් අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් මෙම සංශෝධිත යෝජනාව ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:22 බස් නැවතුම්පළ ,පොදු වෙළෙඳ සැළ හා කාර්පාක් කඩකාමර සඳහා ගිවිසුම්ගත වීම 2018 ජූලි මස සිට ක්‍රියාත්මක කිරීම.**

බස්නැවතුම්පොළ/ කාර්පාක් හා සාප්පු කඩ කාමරවල කුළිය 2018 ජූනි මස සිට අයකිරීමට 2018.04.05 වන දින සභා වාරයේදී තීරණය කරන ලද අතර සභාව සතු කඩකාමර 176 ක් පමණ ඇති නිසා එම කඩ සියල්ලේම ගිවිසුම් සකස්කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය බැවින් මෙම ගිවිසුම්ගත වීම,2018 ජූනි මස සිට ක්‍රියාත්මක වන පරිදි 2018 ජූලි මස සිට සිදුකිරීම සුදුසු බවත් ඒ අතරතුර ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබාගැනීම සුදුසු බවත් ගරු උප සභාපති එම්.ටී.එම්.රූම් මැතිතුමා යෝජනා කල අතර එය ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳ අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.නිමල් ගාමිනී වීරසිංහ මැතිතුමා මෙම කඩකුළී විශාල වශයෙන් වැඩි වී ඇති බවත් මේ පිළිබද කඩිනම් පිළිතුරක් නොලැබුනොත් ව්‍යාපාරිකයන් තව තවත් පීඩාවට පත්වන බැවින් මේ පිළිබද නගර සභාව මගින් ගන්නා තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීමට පළාත් සභාවෙන් කඩිනම් සහයක් නොලැබීම පිළිබද පළාත් සභා නිළධාරින්ට අප්‍රසාදය පළ කරන බවත් පවසා සිටින ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූම් මැතිතුමා අදහස් දක්වමින් මේ පිළිබද කඩිනම් පිලිතුරක් අපේක්ෂාවෙන් සිටින බව පවසා සිටින ලදී. ගරු උප සභාපති එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ගෙනෙන ලද යෝජනාව සභාවේ ඒකමතිකව අනුමත විය.

**05:01:23 සභාපති අරමුදලින් චෙක් පත් අත්සන් කිරීම සඳහා සුදුස්සන් තෝරාගැනීම හා අයකරන මුදල තීරණය කිරීම.**

සභාපති අරමුදලින් චෙක් පත් අත්සන් කිරීම සඳහා සුදුස්සන් තෝරාගැනීම හා අයකරන මුදල තීරණය කිරීම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූම් මැතිතුමා යෝජනා කල අතර එය ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු උප සභාපති එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් මේ සඳහා ගරු සභාපති චමික ජයමිණ විමලසේන මැතිතුමා සුදුසු බවට ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදී. මෙහිදී චෙක් පත් අත්සන් කිරීමේ අනෙක් සාමාජිකයා ලෙස ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.නිමල් ගාමිනී

වීරසිංහ මැතිතුමා විසින් ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමාගේ නම යෝජනා කල අතර එම යෝජනාව ගරු කේ.ජී. ප්‍රේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.මෙය සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහිදී සභාපති අරමුදල සඳහා අයකරන මුදල තීරණය කිරීමේදි මන්ත්‍රී කැමැත්ත අනුව මන්ත්‍රී වරුන්ගේ දීමනාවෙන් රු. 500.00 ක්ද උප සභාපතිතුමාගේ දීමනාවෙන් රු. 750.00ක් ද ගරු සභාපතිතුමාගේ දිමනාවෙන් රු.750.00ක මුදලක්ද අය කිරීම සුදුසු බවට ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය. මෙහිදී ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. ප්‍රේමදාස මැතිතුමා තම මන්ත්‍රී දීමනාව පක්ෂයේ දිස්ත්‍රික් අරමුදලට බැර කරන බැවින් තම දායකත්වය පිළිබඳ පක්ෂයෙන් විමසා ගරු සභාවට දන්වන බව ප්‍රකාශ කරන ලදි.

**05ඃ01ඃ24 මාධ්‍යවේදී දීමනාව ගෙවීම.**

මාධ්‍යවේදී දීමනාව ගෙවීම පිලිබඳ තීරණයක් ගත යුතු බවට ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් යෝජනාව සභාවට ඉදිරිපත් කිරිමේදි ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් එක් මාධ්‍යවේදියකු සඳහා රු.750.00 ක දීමනාවක් මාසිකව රු.7500.00 ක උපරිමයකට යටත්ව ලබාදීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ25 ගබඩාකර තබාගැනීම සඳහා ටයර් ලබාගැනීම.**

ගබඩාකර තබාගැනීම සඳහා ටයර් ලබාගැනීමට අවශ්‍ය බව පවසමින් ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරන ලද අතර එහිදී සභාවේ සභික මහත්ම මහත්මීන් විසින් එම ටයර් පිළිබඳ විස්තරයක් ඉල්ලා සිටි බැවින් එය ලබාදෙන ලදී.එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ26 කම්කරුවෙකුගේ දෛනික වැටුප වැඩිකිරීම.**

නුපුහුනු කම්කරුවෙකුගේ දෛනික වැටුප රු.1150.00 දක්වා හා පුහුණු කම්කරුවෙකුගේ දෛනික වැටුප රු.1650.00 දක්වා වැඩිකිරීම සඳහා ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදී. මෙහිදී ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.නිමල් ගාමිනී වීරසිංහ මැතිතුමා විසින් මෙම මිල ගණන් දිස්ත්‍රික් මිල කමිටුවේ අනුමත වී ඇත්නම් ගැටළුවක් නැති බව පවසා සිටි අතර මිල කමිටුවේ අනුමත වී ඇති හෙයින් සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ27 දැන්වීම් පුවරු ටෙන්ඩර් කිරීම**

නව ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් වශයෙන් හා නගරයේ අවිධිමත් ලෙස සිදුකරන බැනර් කටවුට් සඳහා විසඳුමක් ලෙස මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර මෙම එක් පුවරුවක් මාසිකව අවම ලංසුව රු. 3000 ක් බැගින් දැන්වීම් පුවරු ටෙන්ඩර් කිරීම සඳහා ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ28 සභාපති, උපසභාපති, නාගරික මන්ත්‍රිවරුන්ගේ දුරකථන හා ඉන්ධන දීමනා ලබාදීම**

ගරු උප සභාපති හා ගරු මනත්‍රිවරුන් වෙනුවෙන් අදාල චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන සදහා ලබාදිය හැකි උපරිම සිමාව වන රු.5000.00ක මුදල ඉන්ධන දීමනාව ලෙස ලබා දිමටත් දුරකථන දිමනා ලෙස ගරු සභාපතිතුමා සඳහා රු.5000.00 ක්ද , ගරු උප සභාපතිතුමා සදහා රු.4000.00ක්ද ගරු මන්ත්‍රිතුමන්ලා සදහා රු.3000.00ක්ද ලෙසත් වූ උපරිම සිමාව ලබා දීම සුදුසු බවට ගරු උපසභාපතිතුමා විසින් ගෙනෙන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමත විය..

මේ පිළිබඳ ගණකාධිකාරිවරයාගෙන් පැහැදිලි කර ගැනීමක් සිදු කර ගැනීම සඳහා ගරු උප සභාපතිතුමා මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී. මෙහිදී පැහැදිලි කර ගැනීමෙන් පසු නැවත කාරක සභාව මහ සභාවක් බවට පත්කරන ලදී. ඒ අනුව උප සභාපති හා මන්ත්‍රිවරුන් සඳහා ඉන්ධන දීමනාව රු.5000.00 ලෙසත් දුරකථන දීමනාව සභාපති රු.5000.00 උප සභාපති රු.4000.00 හා මන්ත්‍රි දීමනාව රු.3000.00 ලෙසත් උපරිම ගෙවිම සිදුකල හැකි අතර දීමනා ගෙවීමේදි වාහනය හා ගමන් බලපත්‍රයත්, දුරකථන සිම්පතත් අදාළ සභිකයාගේ නමට තිබිය යුතු බව පවසා සිටින ලදි.

**05:01:29 මහජන ක්‍රීඩාංගනය යාබද ඉඩම වාහන ගාල් කරන ස්ථානයක් බවට පත්කිරීම**

නගර සභා ක්‍රීඩාපිටියට යාබද ඉඩම් කොටස මෙම සභාව භුක්ති විදින ලද ඉඩම් කොටසක් වන අතර, මෙයට එම්.ජුනයිදීන් නමැති අයෙකු ඔහුට අයත් ඉඩමක් බව පවසා සභාවට විරුද්ධව බලංගොඩ දිසා අධිකරණයේ නඩුවක් පවරා තිබුන අතර,එහිදීද ඔහුගේ හිමිකම් තහවුරු කිරීමට නොහැකි වීම හේතුවෙන් එය ඉල්ලා අස්කර ගන්නා ලදී.මෙම කරුණු එසේ තිබියදීත් ජුනයිදීන් යන අයගේ ඉල්ලීම මත,මෙම හිමිකම් සම්බන්ධව හිටපු සබරගමුව පළාත් මහ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන්,සබරගමුව පළාත් නීති නිළධාරි සමග හිමිකම් සම්බන්ධව පරීක්ෂණයක් සිදු කරන ලද අතර, එම අවස්ථාවේ ජුනයිදීන් මහතා හට කිසිසේත්ම එම ඉඩම් කොටස අයිති නොවන බව පැහැදිලි කරන ලදී.එබැවින් දැනට වල් බිහිවී ඇති එම ඉඩම් කොටස රථවාහන නැවතුම් ස්ථානයක් ලෙස භාවිතා කිරීමට යොදා ගැනීමට ගරු උප සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එහිදී මෙම ඉඩම පිළිබඳව හා ඉතිහාසයේ මෙම ඉඩමේ භුක්තිය සම්බන්ධ කටයුතුවලදී මුහුණ පෑමට සිදුවූ සිද්ධීන් පිළිබද දීර්ඝ විස්තරයක් සිදුකළ ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමන් විසින් දැනට මේ පිළිබඳ පවතින නීත්‍යානුකුල තත්ත්වය කෙසේ වේදැයි විමසා සිටින ලදි. එතුමා විසින් පැවසූ අදහස් තව දුරටත් සනාථ කරමින් කරුණු දක්වූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා මෙහි නීත්‍යානුකුල තත්ත්වය පිළිබඳ සභාව දැනුවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි. එහිදී ගරු උප සභාපතී එම්. ටී. එම්. රූමි මැතිතුමාගේ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කෙරුණ අතර ලේකම් විසින් කරුණු පැහැදිලි කිරීමෙන් පසුව නැවත ගරු උප සභාපතී එම්. ටී. එම්. රූමි මැතිතුමාගේ හා ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් කෙරුණි. ගරු උප සභාපතී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ලේකම් විසින් ඉදිරිපත් කළ කරුණු අනුව නීත්‍යානුකුල නඩු තීන්දුවෙන් අදාළ ඉඩමේ අයිතිය ජුනයිදීන් ය න අය විසින් සනාථ කිරීමට අපොහොසත් වී ඇති බව සභාවට දන්වා සිටින ලදි.. මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා එම යෝජනාව සම්බන්ධයෙන් තම විරෝධය ප්‍රකාශ කරන ලදි. නමුත් ගරු සභාව බෙදීමකට නොගිය බැවින් මෙම ඉඩම වාහන ගාල් කරන ස්ථානයක් බවට පත්කිරීම සම්බන්ධයෙන් ගෙනා යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05៖01៖30 පුබුදමු ගම්මැද්ද වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

පුබුදමු ගම්මැද්ද වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධ යෝජනාව ගරු උප සභාපතී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ඉදිරිපත් කළ අතර එය ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි. එයට අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමන් විසින් මියගිය ගරු නාගරික මන්ත්‍රී සුගත් ඉන්ද්‍රජිත් මැතිතුමාට ගෞරවයක් වශයෙන් එතුමන් සිහිකර මෙම වැඩසටහන ඇල්ලෙපොල කොට්ඨාශයෙන් ආරම්භ කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි. මෙහිදී පුබුදමු ගම්මැද්ද වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධ යෝජනාව ගරු සභාවේදී ඒකමතික ව සම්මත විය.

**05៖01៖31 යන්ත්‍රෝපකරණ කුලියට ලබාදීම සඳහා මිල ගණන් ලබාදීම**

ඉහත යෝජනාව ගරු උප සභාපතී එම්. ටී. එම්. රූමි මැතිතුමාන් විසින් ඉදිරිපත් කළ අතර එය ගරු නාගරික මන්ත්‍රි නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව ඒ සම්බන්ධයෙන් ගරු සභාව දැනුවත් කරන ලෙස දන්වා සිටින ලදි. එහිදී යන්ත්‍රෝපකරණ අධිකාරියෙන් ගෙන්වා ගත් කුලී ගාස්තු මිල ගණන් ලෙස

| යන්ත්‍ර හෝ වාහන වර්ගය | එක් දිනක් වෙනුවෙන් ගාස්තු ක්‍රමය | අයකරන ගාස්තුව වැට් සහිත ව රු. |
|---|---|---|
| මෝටර් ග්‍රේඩරය | පැය 06 කට අඩු ඕනෑම කාල සීමාවක් සඳහා අවම ගාස්තුව | 18,630.00 |
| | මීටර් පැය 06 ඉක්මවන කාලය සඳහා ගාස්තුව | 3,105.00 |
| බැකෝ යන්ත්‍රය | පැය 06 කට අඩු ඕනෑම කාල සීමාවක් සඳහා අවම ගාස්තුව | 11,040.00 |
| | මීටර් පැය 06 ඉක්මවන කාලය සඳහා ගාස්තුව | 1,840.00 |
| මාර්ග තලනය | එක් දිනක් සඳහා ගාස්තුව පෙ.ව. 8.00 - ප.ව. 5.00 දක්වා | 6,900.00 |
| | ප.ව. 5.00 න් පසු වැඩ කරන සෑම පැයකටම ගාස්තුව | 1,725.00 |

සභාවේ දැනුවත් වීම පිණිස ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම යෝජනාව ගරු සභාවේදී එකමතික ව සම්මත විය.

**ඇස්තමේන්තු අනුමත කරගැනීම**

**05ඃ01ඃ31 බලංගොඩ බස් නැවතුම්පොළ පදික කඩ ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුව**

බලංගොඩ බස් නැවතුම්පොළ පදික කඩ ඉදිකිරීම සඳහා වන එක් කඩ කාමරයක් සඳහා වන ඇස්තමේන්තු ගත මුදල රු.129,185.19 ක ඇස්තමේන්තුව ගරු සභාවේ අනුමැතිය සඳහා ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් යෝජනා කළ අතර එය ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05ඃ02 ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුනරත්න මැතිතුමා***

05ඃ02ඃ01 2018 අයවැය යෝජනා සඳහා වෙන්වී ඇති එක් කොට්ඨාශයකට ලක්ෂ 10ක මුදලින් තුඹගොඩ කොට්ඨාශයේ කිවුළවෙල ග්‍රාමයේ මාර්ගය හා බෝක්කු යොදා බැමියොදා සකස්කිරීම.

2018 අයවැය යෝජනා සඳහා වෙන්වී ඇති එක් කොට්ඨාශයකට ලක්ෂ 10ක මුදලින් තුඹගොඩ කොට්ඨාශයේ කිවුළවෙල ග්‍රාමයේ මාර්ගය හා බෝක්කු යොදා බැමියොදා සකස් කිරීම සඳහා කොට්ඨාශයකට ලක්‍ෂ 10ක මුදල් වෙන් කරන සංවර්ධන වැඩසටහන යටතේ එම මුදල් ප්‍රතිපාදන තම කොට්ඨාශයට ලබාදෙන ලෙස යෝජනා කළ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුනරත්න මැතිතුමා එසේ නොවුණහොත් එම කොට්ඨාශයේ ජනතාවට අසාධාරණයක් බව ප්‍රකාශ කරන ලදි. ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා ඡන්ද දායකයින් 3000 ක් පමණ සිටින තුඹගොඩ කොට්ඨාශයට එම මුදල් ලබාදෙන මෙන් පවසමින් යෝජනාව ස්ථිර කරන ලදි. මෙහිදී ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් එක් කොට්ඨාශයකට වෙන්වූ ලක්‍ෂ 10 ක මුදලින් මන්ත්‍රී ප්‍රතිපාදන ලක්‍ෂ 04 වෙන්කළ පසු ඉතිරි ලක්‍ෂ 06 ක මුදල එම කොට්ඨාශයේ ජනතාවගේ ඉල්ලීම අනුව අදාළ කොට්ඨාශයටම ලබාදීමට අපේක්‍ෂා කරන බව මෙහිදී පවසා සිටින ලදි.

***05ඃ03 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා***

05ඃ03ඃ01 මහජන ක්‍රීඩාංගනය ප්‍රතිසංස්කරණය කිරීම

05ඃ03ඃ02 ක්‍රීඩාංගනය ප්‍රේක්ෂකාගාරය හා ලංකා බැංකුව අසළට වීථි ලාම්පුවක් සවිකිරීම.

05ඃ03ඃ03 ක්‍රීඩාංගනය වටා ඇවිදින මං තීරුවක් සකස් කිරීම

05ඃ03ඃ04 ටෙලිකොම් කල්තොට පාර හන්දිය හා තුඹගොඩ හන්දිය අසළට දිසා නාම පුවරු සවිකිරීම.

05ඃ03ඃ05 පදික කඩ හැකි ඉක්මනින් ලබාදීම.

මෙම යෝජනා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදි. මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා මාස 03 ක පමණ කාලයක සිට මහජන ක්‍රීඩාංගනයේ වළවල් සෑදී ඇති ප්‍රදේශ පස් දමා පිළිසකර කර දෙන මෙන් ඉල්ලා සිටියද තවමත් ඒ පිළිබඳ ක්‍රියාමාර්ගයක් නොගැනීම පිළිබඳ කණගාටු වන බවත් ක්‍රීඩාංගනයේ ප්‍රේක්ෂකාගාරය පිටුපස අඳුරු සහිත බැවින් යකඩ ආවරණයක් සහිත වීථි ලාම්පුවක් යෙදීමට කටයුතු කිරීම සුදුසු බවත් ක්‍රීඩාංගනය වටා ඇවිදින මංතීරුව නව නගර සැලැස්මේ අන්තර් ගත බැවින් ඒ සඳහා අවධානය යොමු කරන ලෙසත් පවසා සිටින ලදි. ඊට අමතරව පදික කඩ හැකි ඉක්මනින් ලබාදීම කඩිනම් කරන ලෙසත්, ටෙලිකොම් කල්තොට පාර හන්දිය හා තුඹගොඩ හන්දිය අසළට දිසා නාම පුවරු සවිකිරීම සඳහා අවශ්‍ය නම් අනුග්‍රාහකයෙක් සොයාදිය හැකි බවද තානායම් පිවිසුම් පාරේ ඇති අනතුරු දායක කම්බිය ඉවත් කළ යුතු බවද ගරු සභාවට පෙන්වා දෙන ලදි.

***05:04 ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා***

05:04:01 බෝම්බුව පන්සල වත්ත කාණු පද්ධතිය සකස් කිරීම.

05:04:02 බෝම්බුව ගඟ පාර කාණු පද්ධතිය සකස් කිරීම.

05:04:03 බෝම්බුව ආචාරිමලේ අතුරු මාර්ගය මීටර් 100 කොන්ක්‍රීට් කිරීම.

05:04:04 වතුකාරගොඩ ඇළ කොටසේ ඉතිරි වී ඇති මීටර් 10 ක පමණ බැම්ම ඉදිකිරීම.

05:04:05 උඩකන්ද ගල්වල පාර මාර්ගයේ ප්‍රදේශ කීපයක කාණු පද්ධතිය සකස්කිරීම.

05:04:06 කොටුගොඩැල්ල නන්දාවති මහත්මියගේ පාර 100m කොන්ක්‍රීට් කිරීම හෝ තාර දැමීම

05:04:07 බෝම්බුව අමරපාල මහතාගේ කඩය අසළ කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම.

05:04:08 බලංගොඩ උඩකන්ද මාර්ගය අළුත්වැඩියා කර කාණු පද්ධතිය සකස්කර දීම.

05:04:09 උඩකන්ද පාර අතුරු මාර්ගයක් වන පහළ කොටස පිළියෙල කිරීම.

ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි. මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් තම යෝජනා අතරින් වතුකාරගොඩ ඇළ කොටසේ ඉතිරි වී ඇති මීටර් 10 ක පමණ බැම්ම ඉදිකිරීම ඉතා කඩිනමින් සිදුකර ගත යුතු සංවර්ධන කටයුත්තක් වන බැවින් ඒ සඳහා අවධානය යොමු කරන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදි.

***05:05 ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය***

05:05:01 දොරවෙළ අසළ සිට මුගුණමලය අනදමෙත්ගම හරහා නන්දන කඩය දක්වා වූ මාර්ගය මැණුම් කටයුතු කර ජාතික මැණුම් ජාලයට ඇතුළත් කිරීමට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත මැණුම් ඉල්ලීමක කිරීම.

05:05:02 මුගුණමලේ අනදමෙත්ගම විදුලි පහන් නඩත්තු කිරීම.

05:05:03 ජේ.සී.බී. යන්ත්‍රය හා ටිපර් රථය කාණු ගොඩදැමීම සඳහා දින 5ක් ලබාගැනීම.

05:05:04 අනදමෙත්ගම ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම.

05:05:05 මුගුණමලේ සුසාන භූමියේ ආරක්ෂිත වැට ඉදි කිරීම.

05:05:06 නගර සභාව මගින් අනදමෙත්ගම පෙර පාසලක් ඉදිකිරීම

05:05:07 කිරිදිගල කොට්ඨාශයේ අඩු ආදායම්ලාභීන් වෙත වැසිකිලි ඉදිකර දීම.

ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි. මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් දැනට අනදමෙත්ගම පවත්වන පෙර පාසල නගර සභාව මගින් පවත්වාගෙන යාම සඳහා කටයුතු ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටින ලදි.

***05:06 ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා***

05:06:01 බලංගොඩ ප්‍රධාන බස් නැවතුම්පොළ පුද්ගලික බස් සඳහා කාර්යාලයක් සකස් කිරීම.

05:06:02 බලංගොඩ ප්‍රධාන බස් නැවතුම්පොළ අවශ්‍ය ප්‍රමාණයට වැසිකිලි පහසුකම් ඇති කිරීම.

05:06:03 කහටපිටිය පාර දීර්ඝ කර නගර සභා සීමාවේ වීථි ලාම්පු සවිකිරීම

ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි. මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් අවම පහසුකම් යටතේ ධාවන සටහනක් පවා නිසි ලෙස ලියා ගැනීමට නොහැකිව දුෂ්කරතාවයට පත්ව සිටින පුද්ගලික බස් ධාවකයන් සඳහා කාර්යාලයක් සකස් කිරීම කඩිනමින් සිදුකරන ලෙසත් ඔවුනට නොමිලේ වැසිකිළි පහසුකම් ලබාදීම හෝ ඔවුන් සඳහා පොදු වැසිකිළියක් සකස් කර දෙන ලෙසත් පවසා සිටි අතර කහටපිටිය පාර දීර්ඝ කර නගර සභා සීමාවේ වීථි ලාම්පු සවිකිරීමේ කටයුතු පිළිබඳව අවධානය යොමුකරන මෙන් පවසා සිටින ලදි.

### *05:07 ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය*

05:07:01 හුණුකුඹුර බලන්ගොඩ ගෙදර සුභ සාධක සංගමයේ මරණාධාර සමිතියට අඩි 10:20 ජංගම මඩුවක් ලබාදීම පෞද්ගලික මන්ත්‍රි ප්‍රතිපාදන යටතේ සිදුකිරීම.

05:07:02 හුණුකුඹුර කොට්ඨාශයේ ආනන්ද මෛත්‍රී මාවත,සුදර්ශනගම,හුණුකුඹුර යන ගම් ඒකාබද්ධව පවත්වාගෙන යන මෛත්‍රී අවමංගල්‍යාධාර සමිතිය සඳහා අඩි 10:20 ජංගම මඩුවක් ලබාදීම හා ශබ්ද විකාශන යන්ත්‍රයක් ලබාදීම.

05:07:03 හුණුකුඹුර සුදර්ශන ගම ඉහළ මාර්ගයේ ඉදිකර ඇති බැම්මේ ඉතිරි කොටස සකස් කිරීම

05:07:04 ගාලේවත්ත හුණුකුඹුර පාලම ඉදිකිරීම සඳහා අවශ්‍ය කොන්ක්‍රීට් තළාද 3ක් ප්‍රවාහනය කිරීම පෞද්ගලික මන්ත්‍රි ප්‍රතිපාදන යටතේ සිදුකිරීම.

05:07:05 නිවෙස් 3ට සෙවිළි තහඩු ලබාදීම.

ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි. මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ගාලේවත්ත හුණුකුඹුර පාලම ඉදිකිරීම සඳහා අවශ්‍ය කොන්ක්‍රීට් තළාද 3ක් ප්‍රවාහනය කිරීම ඉතා අත්‍යවශ්‍ය බැවින් කඩිනමින් එය ඉටුකර දෙන ලෙසත් හුණුකුඹුර සුදර්ශන ගම ඉහළ මාර්ගයේ ඉදිකර ඇති බැම්ම ඉරිතලා ගොස් ඉතා අවධානම් තත්ත්වයක පත්ව ඇති බැවින් අවශ්‍ය පිළිසකර කිරීම් කඩිනමින් සිදුකර දෙන ලෙසත් ඉල්ලා සිටි අතර ඉහත දක්වා ඇති පරිදි සුභ සාධක සංගම් සඳහා ජංගම මඩු ලබාදීම තම පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ සිදු කිරීමට අපේක්ෂා කරන බවත් දන්වා සිටින ලදි.

### *05:08 ගරු නාගරික මන්ත්‍රිනී එම්. පී. ශාන්තිලේඛා මැතිතුමිය*

05:08:01 2018-04-05 වන දින ඉදිරිපත්කල යෝජනා අතරින් නිවාස හා වැසිකිළි තැනීම සඳහා ආධාර ලබාදීම යන යෝජනාව මන්ත්‍රි ප්‍රතිපාදන වන රු.400,000.00 මුදල යටතේ සිදුකිරීම.

05:08:02 බලංගොඩ උඩ ඇල්ලෙපොළ සරස්වතී පාර කෙලවරෙහි පිහිටි කනත්තේ සොහොන් ගෙය පිළිසකර කිරීම.

05:08:03 බලංගොඩ උඩ ඇල්ලෙපොළ කරවිගහ ඇල්ල ස්ථානයේ පිහිටි ජලටැංකිය ප්‍රතිසංස්කරණය කිරීම.

05:08:04 බලංගොඩ උඩ ඇල්ලෙපොළ පදිංචි එම්.ජී. ජේන් නෝනා මහත්මියගේ නිවසට යන පාරෙහි පැතිබැම්ම හා පාර සංවර්ධනය කිරීම.

05:08:05 බලංගොඩ උඩ ඇල්ලෙපොළ වැවේළිද පාර කාණු පද්ධතිය පිළිසකර කිරීම.

05:08:06 උඩ ඇල්ලෙපොළ ,පල්ලෙකුඹුර පාර ප්‍රදේශයට පොදු ජල නළයක් ලබාදීම.

05ඃ08ඃ07 කුමාරගම පිරුවන පාර දෙපස කාණු පද්ධතිය පිළිසකර කිරීම.

05ඃ08ඃ08 බලංගොඩ නගර සීමාවේ හැපිකිඩ්ස් පෙර පාසල් මාවතේ කාණු පද්ධතිය සකස් කිරීම.

ගරු නාගරික මන්ත්‍රිනී එම්. පී. ශාන්තිලේඛා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. ප්‍රේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදි. තම යෝජනා ඉතා සරලව ඉදිරිපත් කර ඇති හෙයින් නැවත විස්තර කිරීමක් අනවශ්‍ය බව පැවසූ ගරු නාගරික මන්ත්‍රී තුමිය ඊට අමතරව පහත කරුණු පිළිබඳ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටින ලදි. එනම්

01. දැනුවත්වීම පිණිස සභාවේ ගිවිසුම්වල නෛතික ලේඛන වල ඡායා පිටපත් ලබාදෙන ලෙස ඉල්ලා සිටීම
02. නගර සභාවේ පවතින කම්කරු ප්‍රශ්නය පිළිබඳ අවධානය යොමු කිරීම
03. තම ප්‍රදේශයේ වීථි ලාම්පු ස්ථාපිත කර ගැනීම

ඊට අමතරව ගරු සභාවේ නීතිමය කටයුතු වලදී තම වෘත්තීය මට්ටමින් වේතනයක් ලබා නොගෙන දායකත්වය සැපයීමට සූදානම් බවත් නීතී ආධාර ඒකකය යටතේ සංවිධානය කරන වැඩසටහන් වලට ඉදිරියේ දී ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගේ දායකත්වය ලබාදෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.

***05ඃ09 ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා***

05ඃ09ඃ01 නගර සභා පෙර පාසල් පාලිකාවන්ගේ දීමනාව රු.10,000.00 සිට රු.15,000.00ක් දක්වාව වැඩිකිරීම.

05ඃ09ඃ02 රාස්සගල පාරේ විදුලබල මණ්ඩලය අසළ ලී මඩුව පාර,දෙමළ විද්‍යාල මාවත, දෙණියකුඹුර නීලිකා මහත්මියගේ නිවස පාර,වැවවත්ත උද්‍යාන මාර්ග සහ බුළත්ගම විද්‍යාලය පිවිසුම් මාර්ගයේ නඩත්තු කටයුතු සිදුකිරීම.

05ඃ09ඃ03 2018 අයවැය ලේඛනය සඳහන් පරිදි එක් එක් කොට්ඨාශ සඳහා වෙන්කර ඇති රු.1,000,000.00 ප්‍රතිපාදනය අදාළ කොට්ඨාශයෙන් තේරි පත් වූ මන්ත්‍රිවරුන්ට ලබාදීම.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමන් විසින් තම යෝජනා ස්ථිර කරන ලදුව තම යෝජනා පිළිබඳ ගරු සභාවේ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටින ලදි. එහිදී රු. 10,000.00 ක් වැනි දීමනාවක් පෙර පාසල් පාලිකාවන් සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවන බව පැවසූ ගරු මන්ත්‍රීතුමන් විසින් එම මුදල දීමනාව රු. 15,000.00 තෙක් වැඩි කිරීම සිදුකරන ලෙසත් එමෙන්ම 2018 අයවැය හි සඳහන් පරිදි එක් එක් කොට්ඨාශ සඳහා වෙන්කර ඇති රු.1,000,000.00 ප්‍රතිපාදනය අදාළ කොට්ඨාශයෙන් තේරි පත් වූ මන්ත්‍රිවරුන්ට

ලබාදීම ඒ අයුරුන්ම සිදුකරන ලෙසත් ඉල්ලා සිටින ලදි. එහිදී අදහස් දක්වූ ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා පෙර පාසල් පාලිකාවන්ගේ දීමනාව අයවැයෙන් වෙන් කර ඇති පරිදි රු. 10,000.00 ක් බැවින් ඊළඟ අයවැයේදී ඒ පිළිබඳ කටයුතු සිදුකිරීමට අපේක්ෂා කරන බවත් එක් කොට්ඨාශයකට වෙන්වූ ලක්ෂ 10 ක මුදලින් මන්ත්‍රී ප්‍රතිපාදන ලක්ෂ 04 වෙන්කළ පසු ඉතිරි ලක්ෂ 06 ක මුදල එම කොට්ඨාශයේ ජනතාවගේ ඉල්ලීම අනුව අදාළ කොට්ඨාශයටම ලබාදීමට අපේක්ෂා කරන බව මෙහිදී පවසා සිටින ලදි.

***05:10 ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය***

05:10:01 කරව්කැටිය කාණු පද්ධතිය සකස් කිරීම.

05:10:02 මහමෙව්නා භාවනා මධ්‍යස්ථානය පාර කාණු පිළිසකර දීම.

05:10:03 උඩකන්ද පාර කාණු පස් ගොඩවල් ඉවත්කර දීම හා කාණු බැමි සකස්කර දීම.

05:10:04 ගල්වල පාර කාණු සකස්කර දීම

ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය විසින් ඉහත ඉදිරිපත් කරන යෝජනා ස්ථිර කරන ලදි. මෙහිදී අදහස් දක්වමින් උඩකන්ද පාරේ කාණු වල පස්ගොඩවල් පිරී යාම නිසා මහජනතාවට ඉතාමත් අපහසුකාරී තත්ත්වයකට පත්වී ඇති හෙයින් එම කාණු කඩිනමින් පස් තට්ටු ඉවත් කර පිරිසිදුකර දෙන මෙන් ඉල්ලා සිටි අතර කරව්කැටිය මහමෙව්නා භාවනා මධ්‍යස්ථානය පාර, ගල්වල පාර කාණු පිළිසකර කරදීම පිළිබඳව ගරු සභාවේ කඩිනම් අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදි.

***05:11 ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා***

05:11:01 රිසාලා සමාජ සේවා සුහසාධක සංගමයට LED රූපවාහිනි යන්ත්‍රයක් ලබාදීම.

05:11:02 කල්තොට පාරේ පෞද්ගලික බස්රථවල වේගය පාලනය කිරීමට කටයුතු කිරීම

05:11:03 කල්තොට පාරේ ප්‍රධාන මුස්ලිම් දේවස්ථානය ඉදිරිපිට මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගයේ කාණු පද්ධතිය සකස්කර කොන්ක්‍රීට් ආවරණ යොදා පාසල් ළමුන්ට හා පදිකයන්ට යාමට පහසුව සලසා දීම.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි. මෙහිදී රිසාලා සමාජ සේවා සුහසාධක සංගමයට LED රූපවාහිනි යන්ත්‍රයක් ලබාදෙන ලෙසත්, කල්තොට පාරේ පෞද්ගලික බස්රථවල අධික වේගය පාලනය කිරීම සඳහා පුද්ගලික බස්රථ සංගමය හා පොලිසිය දැනුවත් කළ යුතු බවත් කල්තොට පාරේ ප්‍රධාන මුස්ලිම්

දේවස්ථානය ඉදිරිපිට මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගයේ කාණු පද්ධතිය සකස්කර කොන්ක්‍රීට් ආවරණ යොදා නොමැති හෙයින් පාසල් ළමුන් හා පදිකයන් අනතුරු වලට පත්වී ඇති හෙයින් මේ සඳහා කඩිනමින් කොන්ක්‍රීට් ආවරණ යොදා සකස් කළ යුතු බව ගරු සභාවට ප්‍රකාශ කරන ලදි.

***05:12 ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා***

05:12:01 කිරිදිගල වැලිහරනාව වටරවුම් පාර සංවර්ධනය කිරීම.

05:12:02 කිරිදිගල ප්‍රාර්ථනා බෝධිය අසළට කසළ දැමීමේ භාජනයක් ලබාදීම.

05:12:03 මුගුණමලේ ගල්පල්ල අරාව ප්‍රදේශයට පානීය ජලය ලබාදීම සඳහා ජලනල එළාදීම.

ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි. මෙහිදී කිරිදිගල වැලිහරනාව වටරවුම් පාර සංවර්ධනය කිරීම කඩිනම් කර දෙන ලෙසත් මහජන සෞඛ්‍ය පරීක්ෂක දැනුවත් කර කිරිදිගල ප්‍රාර්ථනා බෝධිය අසළට කසළ වෙන්කර දැමීමේ භාජනයක් ලබාදීමට කටයුතු යොදන ලෙසත් ගරු සභාවට දන්වන ලද අතර මුගුණමලේ ගල්පල්ල අරාව ප්‍රදේශයට පානීය ජලය ලබාදීම සඳහා ජලනල එළාදීම මන්ත්‍රී මුදල් ප්‍රතිපාදන වෙන්වී තිබේ නම් තමාට හිමි ප්‍රතිපාදන යොදා එය පිළිසකර කරන ලෙස සභාව දැනුවත් කරන ලදි.

***05:13 ගරු නාගරික නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා***

05:13:01 ආනන්ද මෛත්‍රී මාවත ජලකාණුව සඳහා කොන්ක්‍රීට් ස්ලැබ් යෙදීම

05:13:02 ආනන්ද මෛත්‍රී මාවත සුදර්ශන ගම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම

05:13:03 සුදර්ශනගම එම්.ප්‍රියන්ත මහතාගේ නිවස ඉදිරිපිට පැතිබැම්ම ඉදිකිරීම.

ගරු නාගරික නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමන් විසින් ඉහත ඉදිරිපත් කරන යෝජනා ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමියගේ යෝජනා අතරට ගෙන ක්‍රියාත්මක කරන ලෙස ගරු සභාවට දන්වා සිටින ලද අතර එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්තිර කරන ලදි.

**06. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

ගරු සභාවේ දැන ගැනීම පිණිස කාරක සභා වාර්තා ලෙස මුදල් කමිටු වාර්තා, පුස්තකාල උපදේශක කමිටු වාර්තාව, සෞඛ්‍ය ඝන අපද්‍රව්‍ය හා පරිසර උපදේශන කමිටු රැස්වීම් වාර්තා හා ආදායම් ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදි.

07. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 6,639,326.91 |
| වෙනත් ලැබීම් | 983,645.96 |
| මුලු ලැබීම් | 7,622,972.87 |
| පුනරාවර්ථන වියදම් | 5,595,865.14 |
| වෙනත් වියදම් | 1,240,211.01 |
| මුලු වියදම් | 6,836,076.15 |

08. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්

**ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් නගරයේ අලුතින් ඉඩමක් මිලදී ගෙන සැලැස්මක අනුමත කර ගැනීම සඳහා නගර සභාව වෙත පැමිණි අවස්ථාවේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් එම ඉඩමට අදාළ මුල් බිම්කට්ටි සැලැස්ම හා දෙපස ඉඩම් වල බිම් කට්ටි සැලැස්ම ඉල්ලා සිටීම ඉතා අපහසුකාරී තත්ත්වයක් බවත් ඉන් පීඩාවට පත්වන ජනතාව ඉදිකිරීම් නවතා දැමීමේ තත්ත්වයකට පත්ව ඇති බවත් පැහැදිලි කරන ලදි. බැංකු ණයක් ලබාගෙන ඉදිකිරීමක් සිදුකරන අයෙකුට බැංකු ණය අනුමත වන තෙක් සැලැස්ම අනුමත කර ගැනීමට නොහැකි තත්ත්වයකට පත්ව තිබීම ඉතා අවාසනාවන්ත තත්ත්වයක් බවත් පවසා සිටින ලදි. බිම් කට්ටි සැලැස්මෙන් පමණක් සැලසුම් අනුමත කිරීමේ ක්‍රමවේදයක් සලසා දෙන ලෙසද එමෙන්ම රූඩ් 01 ට වැඩි බිම්කට්ටි සැලසුම් හා වර්ග අඩි 4000ට වැඩි ඉදිකිරීම් සැලසුම් පමණක් නාගරික සංවර්ධන අධිකාරිය මගින් අනුමත කිරිමේ පෙර පැවති ක්‍රියාපටිපාටිය නැවත සකස් කරන ලෙසද ඒ සඳහා නගර සභාව වෙත බලය පවරා ගැනීමට කටයුතු ක්‍රියාත්මක කළහොත් මහජන පීඩාව අවම වනවා සේම නගර සභාව වෙත ලැබෙන ආදායම ඉහළ නංවා ගතහැකි බව මෙහිදී පෙන්වා දෙන ලදි.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා**

නගර සභා ගරු මන්ත්‍රී රවින්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් දක්වන ලද අදහස් අනුමත කරමින් අදහස් දැක්වූ නගර සභා ගරු මන්ත්‍රී ඩබ්. එම්. නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා දැනට පවතින නීතිරීති සමග ගොඩනැගිලි අයදුම්පත් අනුමත වීමට වැඩි කාලයක් ගතවීම හා බෑවුම් සහිත ඉඩම් පමණක් නොවන සෑම ඉඩමක්ම ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත යැවීම අනවශ්‍ය කරුණක් බවත් පවසා සිටින ලදි.

විදුලිය, ජලය, වීථිරේඛා, නොපවරා ගැනීම් සඳහා නගර සභාව වෙත පැමිණෙන මහජනයාට එම සේවාවන් කඩිනමින් ලබාදීමට කටයුතු කිරීම නගර සභාව සතු වගකීමක් බව පෙන්වා සිටින ලදි. එමෙන්ම පෙරදී නාගරික සංවර්ධන අධිකාරිය හා මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරුන්ගේ

බලය නගර සභා සභාපතිට තිබූ බවත්, සභාව විසුරුවා හැරි කාලවලදී එම බලය නැවත පවරා ගෙන ඇති හෙයින් යළිත් එය ලබාගැනීමට කටයුතු කළයුතු බව දන්වා සිටින ලදි. මහජනතාව බොහොමයක් සැලසුම් අනුමත කිරිමේදී ප්‍රමාදය පිළිබඳ කළකිරීමෙන් පසුවන බවත් ආයතන බොහෝමයකින් ප්‍රතික්ෂේප වූ නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරියා වෙනුවට එම ආයතනයෙන් වෙනත් නිලධාරියෙකු ගෙන්වා ගෙන නිරන්තරයෙන් ජනතාව පැත්තෙන් සිතා ජනතා සේවයක් ලබාදීමට කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා**

පාසල් ළමුන්ගෙන් වැසිකිළි යාමට මුදල් අයකිරීම නුසුදුසු බැවින් එම අවශ්‍යතා නොමිලේ ලබාදීම සුදුසු බව පැවසූ ගරු මන්ත්‍රීතුමන් විසින් බළන්ගොඩ බස් නැවතුම්පොළ පවතින තැබෑරුම එතනට කිසිසේත්ම නුසුදුසු බවත්, පූජ්‍ය පක්ෂය කුඩා ළමුන් කාන්තාවන් හා සාමාන්‍ය ජනතාව ඉන් මහත් අපහසුතාවයකට පත්වන බවත් පෙන්වා දුන් අතර කඩිනමින් ඒ සඳහා වෙනත් සුදුසු ස්ථානයක් ලබාදීමට කටයුතු කරන ලෙසද දන්වන ලදි. එමෙන්ම පොළ භූමිය සෙනසුරාදා හා සඳුදා දින 02 ක් පවිත්‍ර කිරීමට කටයුතු කිරීමද වැදගත් බව පෙන්වා සිටින ලදි.

**ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

හිටපු උප සභාපති සුනිල් කැමිලස් මහතාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළකළ නගර සභා ගරු මන්ත්‍රීතුමන් විසින් ඒ වෙනුවෙන් ශෝක පණිවිඩයක් ගරු සභාව වෙතින් යවන මෙන් ඉල්ලා සිටින ලදි. අභාවප්‍රාප්ත හිටපු උප සභාපතිතුමා නගරයේ සුභ සිද්ධිය වෙනුවෙන් ඉටු කළ විශේෂ සේවය නැවත වරක් ගෞරවයෙන් සිහිපත් කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවද වැඩි දුරටත් පවසා සිටින ලදි.

බළන්ගොඩ මහජන පොළ භූමියේ වැසිකිළිය අසළ මාළුකඩ පවත්වාගෙන යාම ඉතා අපිරිසිදුකාරී බැවින් මේ සඳහා පිළියමක් යෙදිය යුතු බවත්, බැම්මකින් හෝ වෙන්කර වැසිකිළි ආවරණය කිරීමට කටයුතු සිදුකිරීම සුදුසු බවත් මෙහිදී පෙන්වා දෙන ලදි.

බළන්ගොඩ රෝහල් භූමියේ මහජනයාගේ වාහන ගාල්කිරීමට ස්ථානයක් නොමැති බව විශාල අඩුපාඩුවක් බැවින් ඒ පිළිබඳ සභාවක් ලෙස අවධානය යොමුකළ යුතු බව පැවසූ ගරු මන්ත්‍රීතුමා බළන්ගොඩ විදුලිබල මණ්ඩලය පූර්ව දැනුම්දීමකින් තොරව විදුලිය විසන්ධි කිරීම පිළිබඳ එම ආයතනය දැනුවත් කළයුතු බවත් මෙහිදී පවසා සිටින ලදි.

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය**

මහජන පොළ භූමියේ නිදැල්ලේ සිටින හරක් ඉවත් කිරීමට සුදුසු පිළියමක් ගතයුතු බවත්, ළමා උද්‍යානය තණකොළ කැපීම කඩිනම්කළ යුතු අතර, මහජන ක්‍රීඩා පිටිය ප්‍රේක්ෂකාගාරය ඉදිරිපිට කාණු පද්ධතිය ඉතා අපිරිසිදු බවත්, වැසිකිළි බටයක් කාණුවට හරවා ඇත්දැයි සැකයක් ඇති හෙයින් ඒ පිළිබඳ සොයාබැලීම කල යුතු බවත් ගරු සභාවට දන්වා සිටින ලදි. එමෙන්ම පොදු වෙළඳසැලේ පරණ වැසිකිළි 02 පිටාර ගලන තත්ත්වයක පත්ව ඇති බැවින් ඒවා කඩා ඉවත් කළ යුතුව පවතින

බවත් පොදු වෙළඳසැල ප්‍රධාන දොර ඉතා අබලන් තත්ත්යකට පත්ව ඇති බැවින් පිළිසකර කළ යුතුව ඇති බවත් පෙන්වා සිටින ලදි.

එමෙන්ම පොදු වෙළඳසැල මස්කඩ හා මාළු කඩවල කිසිදු පිළිවෙළක් නොමැති බැවින් ඉදිරිපස කාණු පද්ධතිය ද ඉතා අපිරිසිදු වී ඇති හෙයින් මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ අවධානය ඒ පිළිබඳ යොමු කරන ලෙස පවසා සිටින ලදි.

බස් නැවතුම්පොළ උඩු මහලේ වැසිකිළි ඉතා අපිරිසිදු හා විදුලි රැහැන් කැඩී ඇති බැවින් බැවින් ඒවා පිළිසකර කිරීමට ද අවධානය යොමු කළ යුතු බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමිය එම ස්ථානයට යාබඳ කඩ කාමරය පුද්ගලික පරිහරණය සඳහා යොදාගන්නා අතර විදුලි බිල නගර සභාවෙන් ගෙවන බවට දැනගැනීමට ලැබී ඇති බවත් ඒ පිළිබඳ අවධානය යොමු කල යුතු බවත් මෙම කරුණු සියල්ල නව සභාවක් ලෙස නගරයේ උන්නතිය උදෙසා ඉටුකර දීමට කටයුතු යොදමුයි පවසමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

බළන්ගොඩ මූලික රෝහලේ නව පස් මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සිදුකර තිබෙන්නේ භික්ෂු වාට්ටුව කඩා ඉවත්කර වුවද නව ගොඩනැගිල්ලේ භික්ෂු වාට්ටුවක් නොමැති වීම පිළිබඳ නායක හාමුදුරුවරු ප්‍රමුඛ මහා සංඝරත්නය විසින් ලිපියක් එවා දන්වා ඇති බවත් ඒ පිළිබඳ පළාත් සභාව දැනුවත් කර හැකි විසඳුමක් ලබාදෙන ලෙසත් ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් සභාව දැනුවත් කරන ලද අතර රෝහල ඉදිරිපිට මහජන රථගාල එම ස්ථානයේ ත්‍රීරෝද කුළී රථ හිමියන්ගේ ඒකාධිකාරයක් බවට පත්ව ඇති බව පවසා සිටින ලදි.

එමෙන්ම පදික කඩ කඩිනමින් සෑදීම, උසාවි භූමියේ ජලය කාර් පාර්ක් කඩ කාමර මැදින් ගලායාම නිසා එම ස්ථානවාසීන් අපහසුතාවයට පත්වීම, මඩවලක් බවට පත්ව ඇති තුරු උයන පෙර පැවති තත්ත්වයට පිළිසකර කිරීම, බළන්ගොඩ කුමාර විද්‍යාලය අසළ මාර්ගය දෙපස දවස පුරා වාහන ගාල් කර තිබීම නැවැත්වීම පිළිබඳ ගරු සභාපතිතුමාගේ විශේෂ අවධානය යොමුකරන ලෙස සභාව දැනුවත් කළ ගරු නාගරික මන්ත්‍රීතුමා විසින් කාණු පද්ධතිය පිරිසිදු කර දීම පිළිබඳ ස්තුතිය පිරිනමන බව දන්වා සිටින ලදි.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා**

2002 වසරේ සිට 2006 වසර දක්වා උප සභාපති සුනිල් කැමිලස් මැතිතුමාට ශෝකය පළකළ ගරු නාගරික මන්ත්‍රීතුමා විසින් සිංහ සමාජය හරහා නගරයේ සංවර්ධනය උදෙසා විශාල සේවාවක් සිදුකළ බව සිහිපත් කරන ලදි.

වෛරී දේශපාලනයක් නොකරන බවට ප්‍රකාශ කළද මේ වන විට එසේ සිදුකරන බව හැඟී යන බවත් පොළ කඩ ටෙන්ඩර් කිරීම සම්බන්ධව කමිටුවකදී සාකච්ඡා කර ඇති බවත් එයට සම්පූර්ණ විරෝධය පළකරන බවත් පවසා සිටින ලදි.

මෙම සභාවේ සභාපති පත්කිරීමට දායකත්වය ලබා දුන්නද තම එකඟතාවයන් නොමැති හෙයින් මේ පිළිබඳ කතාකිරීමට සිදුවී තිබෙන බවත් සෑම දෙයක් දෙසම වෛරීව නොබලා පාක්ෂිකයන් හා බදු ගෙවන ජනතාව යන දෙපක්ෂයම සතුටු වන පරිදි සභාව ගෙන යාම වගකීම බවත් පවසා සිටින ලදි. එමෙන්ම මැණික් කඩකාමර ටෙන්ඩර් කාලය අවසන් වී තිබුණද තවමත් ටෙන්ඩර් නොකිරීම

පිළිබඳ කරුණු විමසූ ගරු නාගරික මන්ත්‍රීතුමන් විසින් කසළ ටෙන්ඩරය පිළිබඳ නිසි අධීක්ෂණය කරමින් ගන්නා ඉදිරි පියවර පිළිබඳ සියලු දෙනා දැනුවත් කරන ලෙසද දන්වා සිටින ලදි.

උප සභාපති හා නාගරික මන්ත්‍රීවරුන් සඳහා තවමත් කාර්යාලයක් ලබානොදීම පිළිබඳ කණගාටුව පළකරන බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා මහජනතාව හමුවීමට ස්ථානයක් ලබානොදී මන්ත්‍රීවරුන් අපහසුතාවයට පත්නොකරන ලෙස සභාවට කරුණු දක්වන ලදි.

එමෙන්ම මන්ත්‍රී යෝජනා වශයෙන් ඉදිරිපත් කළ නිවාස ආධාර ලබාදීම කඩිනමින් සිදු කරන ලෙස දන්වූ එතුමා තානායම පිවිසුම් මාර්ගය පටන් ගන්නා ස්ථානය කඩා වැටී ඇති බවත් එම ස්ථානය පිළිසකර කිරීමට තම මන්ත්‍රී ප්‍රතිපාදන ලක්ෂ 02 ලබාදීමට හැකි බවත් දන්වා සිටින ලදි. සභාව මගින් සිදුකරන සෑම යහපත් කටයුත්තකටම සහාය ලබාදෙන බව පවසා සිටිමින් තම කරුණු දැක්වීම අවසන් කරන ලදි.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

ඕලුගංතොට රෝහලට යන ප්‍රධාන මාර්ගයේ වලවල් සෑදී ඇති හෙයින් රෝගීන්ට යාමට අපහසු තත්ත්වයක් ඇතිවී තිබෙන බවත් පළාත් සභාවෙන් එය සංවර්ධනය කරන තෙක් බලා නොසිට අසරණ රෝගීන් පිළිබඳ මානුෂිකව සිතා බලා නගර සභාවෙන් ප්‍රිමික්ස් යොදා පිළිසකර කිරීමට කටයුතු කරන්නේනම් මහගු ක්‍රියාවක් බව පෙන්වා දෙන ලදි.

එමෙන්ම ඕලුගංතොට සුසාන භූමියේ මෘත ශරීර භූමදානය කිරීමේ ගාස්තු රු. 300.00 සිට රු. 1300.00 දක්වා වැඩි වී ඇති බවත් මෙහි ජල සැපයුම පෞද්ගලික අරමුදලින් සිදුකරන අතර ජල බිල්පත ගෙවන්නේ ද ගම්වාසීන් විසින් බැවින් අඩු ආදායම් ලාභී ජනකායක් වෙසෙන මෙම ප්‍රදේශයේ ජනතාවට මෙහි මිල සංශෝධනය කර දෙන ඉල්ලා සිටින ලදි.

එමෙන්ම රෝහලට ලෙඩුන් බැලීමට පැමිණෙන මහජනයාට වැසිකිළි පහසුකම් නොමැති බැවින් වැසිකිළියක් ඉදිකර දීමට අවධානය යොමුකරන ලෙසද එතුමා විසින් ඉල්ලා සිටිමින් අදහස් දැක්වීම අවසන් කරන ලදි.

**09. අවසානය**

ගරු සභාවේ කටයුතු සාර්ථකව කරගෙන යාමට සහාය දුන් සියලුම මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වන බව පැවසූ ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් බදු ගෙවන නාගරික ජනතාව තෘප්තිමත් වන පරිදි සේවය සැලසීමට කැපවී සැවොම එක්වී ක්‍රියාකරමුයි පවසමින් ගරු සභාවේ කටයුතු ප. ව. 4.15 ට පමණ අවසන් කරන ලදි.

චමික ජයමිණි විමලසේන,

සභාපති,

බළන්ගොඩ නගර සභාව.